
## America

The U.S.A known as the United States of America is a highly magnificent country. The trees are green and moist with their brown trunks. The rivers and lakes sparkle with fresh clear water. American flora range from different colors and the flowers have soothing scents embedded in their colorful petals. All the fauna are very mysterious and curios but hardly dangerous.

The president of the U.S.A is Mr.George.W.Bush. Two famous U.S.A. vacation spots are the Grand Canyon which has a splendid creamy pink sunset and also the Red Wood Forests are very popular and are home to many wood and animals such as the white tail deer and horseshoe bunny rabbit

This is all the information about America I can give you.

♦ **Ravindu Ranawaka** ( 9yrs )
Sycamore Elementary
Simi Valley, CA, **USA**




## Why do bees dance? මීමැසි නැටුම ?



A bee colony which is a very busy family community is headed by the Bee Queen. Bees live in harmony and obey their queen. Each bee gets its separate work in the hive according to the age. A worker bee becomes, after 20 days, an entrance guard and finally a honey collector. Passing information is very important in building up the honeycomb. The dance of the honey bee is very interesting and remarkable. If a bee knows where the honey is he tells other bees about it in various dance patterns. If the food were near the hive he would perform a round dance. A tail wagging dance shows that the food is more than 80 metres away.

**මී**මැසි ජනතාව ඉතා කාර්යබහුල ය. ඉතා එකමුතු ය. තම නායිකාව වන මීමැසි රැජිණට ඔවුන් කීකරුය. මීවදය තුළ වයසට අනුව ඔවුනට විවිධ රැකියාවන් ඇත. සුළු වැඩ කාරයෙකු දින 20 කට පසු ආරක්ෂක නිළධාරියෙකු ලෙස පත් කෙරේ. වටපිටාවේ තොරතුරු රැස්කිරීම සහ ඒවා සෙසු මීමැස්සන් අතර බෙදා හැරීම වද බැඳීමේදී ඉතා වැදගත් වේ. මීමැසි නැටුමෙන් දක්වන්නේ එම තොරතුරු ය. රවුමට කර කැවෙමින් එකෙකු නැටුවොත් ඒ පැනි ළඟම ඇති බවයි. වලිග තටු වනමින් නටන්නේ පැනි මීටර් 80 ක් පමණ ඈතින් ඇති බව හැඟවීමටයි.

♦ ***Auntie Ramani*** (***රමණී නැන්දා***)

### පුංචි සත්තු

කිචි බිචි කිචි කිචි බිචි කිචි
සද්දෙ ඇහෙනවා
අඹ ගහ උඩ ඉඳගෙන
උන් සිංදු කියනවා
කෑම පිඟන් දෙකක් අරන්
අම්මා එනවා
ගහ අස්සේ හැංගීගෙන ඒව බලනවා

පුංචි ලේනා දුවන් ඇවිත් එකක් ගන්නවා
ගිරා පැටිය පියාඹගෙන අත්තෙ වහනවා
කෑම කන්න අනෙක් සත්තු දුවගෙන එනවා
උන් ඔක්කොම සමගි වෙලා ඒවා කනවා

♦ ***ජයනි අකිලා රාජපක්ෂ*** - මහමායා බාලිකා විදුහල, මහනුවර Sri Lanka


BOC

ලංකා බැංකුව
BANK OF CEYLON

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

**ලන්ඩන් ශාඛාව**

**වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.**

හෙට දවසේ සිහින සැබෑකරන

**NRFC ගිණුමක් අරඹන්න !**

*උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !*

***ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.***

පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්යක්ෂමය.

ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා **301** කි. ඉන් **256** කම කටයුතු පරිගණක ජාලගතකර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දී එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදී මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.

★ ***ආකර්ෂණිය විනිමය අනුපාතිකය.***
★ ***ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.***

ඔබගේම චෙක්පත් **කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන්** යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)

***වැඩි විස්තර සඳහා :***

**No 1, Devonshire Square, London EC2 M4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit**


**දකුණු අයර්ලන්තයේ කොලරේන් ප්‍රාන්තයේ පළවන The Cronicle නම් පුවත් පතේ මේ නොබෝදා පළවූ සටහනක් හා කවි පෙළකි මේ. එය එහි වෙසෙන නව හැවිරිදි සිංහළ දැරියක වන රිද්මි සඳුපමා විසින් ලියන ලද්දකි. ඉගෙනුමට, නැටුමට, ගැයුමට, මෙන්ම කවි පබැඳුමටද ඇය එකසේ දක්ෂ බව අපට අසන්නට ලැබිණ. ගෙට යාබද උයන හෙවත් The Garden Next Door එහි මාතෘකාවයි.**

## The Garden Next Door

**Poetry by**
**Rythmi Sandupama Sandagiri**

A nine year old Sri Lankan girl from Millburn Primary School, Coleraine. Northern Ireland. She writes :

" Since we came to Coleraine we lived beside a man who lives with his mother. After the winter he started work in their small garden. He cut the grass, planted seeds and created the garden very neatly. Now the plants have grown beautifully.

I wasn't really into poetry until one morning when my mother said : Look out the window and write a poem. All of a sudden I got the words in my mind and with that I began to write."

## The garden Next Door

In the garden next door
The plants always wore
Beautiful coloured coats
Odd to say some shaped like boats
They were red, yellow and blue
But stuck to the ground like glue
People say it's so nice to see
Where I live, it's a nice place to be
The plants glow in the Sun
Really like a nice hot bun
We went to visit the other night
But there was a dog ready to bite.
The dog doesn't really bite, it licks you.

# දළදා මාලිගාවට කළ ත්‍රස්ත ප්‍රහාරයට වසර 10 කි



**ශ්‍රී**ලංකාවෙන් කැල්ලක් ඉල්ලා මිනිස් ඝාතනයේ යෙදී සිටින අමානුෂික කොටි ත්‍රස්තවාදීන් විසින් 1998 ජනවාරි 25 වෙනි දින උදෑසන බෝම්බ පුපුරවා මහනුවර ශ්‍රී දළදා මාලිගාවට කරන ලද මහා විනාශයට මෙම ජනවාරි මසට වසර 10 ක් සම්පූර්ණ වන්නේය. එම ඛේදවාචකය සිහිපත් කරන්නට ලන්ඩනයේ වෙසෙන දේශ ප්‍රේමී ශ්‍රීලාංකියින්ගේ සභා රැස්වීමක් පැවැත්වේ.

**දිනය - 2008 ජනවාරි 20 ඉරිදා**
**වේලාව - සවස 230 - 500 දක්වා**

**Swiss Cottage Community Centre**
19 Winchester Road
**London NW 3 3NR**

**ලන්ඩනයේ St Georges රෝහලේ මහාචාර්ය ජයසිංහ මහතා සහ ලන්ඩනයේ සමාධි භාවනා මධ්‍යස්ථානයේ පූජ්‍ය ගුන්නෑපානේ සුමනාරාම හිමියෝ සභාව අමතති.**

**දේශප්‍රේමී ඔබ සැමට ආරාධනයයි ! ♦ කරුණා බස්නායක London NW 2**

## තෙමස් පූර්ණ දානමය පිංකම

ලන්ඩන් වාසී පූජ්‍ය විල්පිට ධම්මරතන හිමිපාණන්ගේ දයාබර මෑණියන් වූ අකුරැස්සේ පදිංචිව සිටි ඩී. බුලේගොඩ උපාසිකා මාතාව අභාවප්‍රාප්ත වූයෙන් ඒ පිළිබඳ තෙමස් පූර්ණ දානමය පිංකම 2008 පෙබර වාරි මස 17 වෙනි දින අකුරැස්සේ විල්පිට දී සිදුකෙරේ.

## තෙමස් පූර්ණ දානමය පිංකම

**ඇලිස් වික්‍රමරත්න විජේවීර මහත්මිය අවුරුදු 97 ක් ආයු වළඳා 2007 ඔක්තෝබර් 20 වෙනි දින අභාවප්‍රාප්තවිය. එම අභාවයෙන් තුන්මාසය පිරෙන මෙම ජනවාරි 20 වෙනි දින එම නිවසේ බණ පිරිත් දේශනා සහිත සංඝගත දක්ෂිණාවකි. එම පින් බෙලෙන් විජේවීර මාතාවට නිවන් සුව පතන්නේ දයාබර දූලා, පුතාලා, ලේලිලා හා බෑනලා ඇතුළු පවුලේ පිරිසයි.**

පිනෙන් ජනිත වාසනාව ළමාවියෙන් විය සපිරී
උපන් හපන්කමින් පුදුම හැකියාවන් මවන සිරී
සසුන් අඹර සඳවන්වී සොළොස් කලාවෙන් සපිරී
චිරං ජයතු යුරෝපයට නව නාහිමි සුමන සිරී!

***කෝ. ආනන්ද හිමි***
**ශ්‍රීලංකා පැරිස් බෞද්ධ විහාරය - ප්‍රංශය**

# ***බ්‍රිතාන්‍යයේ ප්‍රධාන සංඝනායක හිමියන්ට භාරතයේ අභිමානය විශිෂ්ට සම්මානය***

**න**වදිල්ලියේ වෘත්තීයකයන්ගේ ජාත්‍යන්තර සංවිධානයෙන් ලන්ඩනයේ බෞද්ධ යථාර්ථවාදී විහාරාධිපති, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, දශ භාෂා විශාරද, ආචාර්ය වෛද්‍ය සිංගප්පූරුවේ සුමනසිරි නා හිමි පාණන්ට භාරතයේ අභිමානය **Glory of India** සම්මානය පිරිනමනු ලැබිණ.

තෙරේසා මවුතුමිය, ජනපතීන්, සුනිල් ගවස්කාර්, සුනිල් දත්, දේව් ආනන්ද්, ෂාරුක් ඛාන් ආදී භාරතීය වෘත්තීකයන්ට පමණක් පිරිනැමුණු මේ සම්මානය පළමුවරට විදේශීය කෙනෙකුට පිරිනැමුණු වගයි.

භාරතයට 43 වරක් වැඩිය මුන්වහන්සේ නොයෙක් අංශවලින් භාරතයට සේවය කර තිබේ. මීට සමාන්තරව අනගාරික ධර්මපාල සමරු දිනයේ දී මහා බෝධි සමාගම මගින් ජාත්‍යන්තර ධර්මදූත විශිෂ්ට සම්මානය බුද්ධගයාවේ දී උත්සවාකාරයෙන් පිරිනැමිණ.



භාරතයේ අභිමානය සම්මානලාභී ආචාර්ය වෛද්‍ය සුමනසිරි නාහිමියන් නවදිල්ලියේ ශ්‍රීලංකා මහකොමසාරිස් වර ජයසිංහ මහතා සමග ගත් පින්තූරයකි මේ.